## **8.1.2.** තාලපුට සූත්‍රය - සංයුත්ත නිකාය » සළායතන වර්ගය » 8. ගාමණී සංයුක්තය » ගාමණි වර්ගය

### තාලපුටසුත්තං

416. එකං සමයං භගවා රාජගහෙ විහරති වෙළුවනෙ කලන්දක නිවාපෙ. අථ ඛො තාලපුටො[1] නටගාමණි යෙන භගවා තෙනුපසඞ්කමි. උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො තාලපුටො නටගාමණි භගවන්තං එතදවොච: සුතං මෙතං භන්තෙ පුබ්බකානං ආචරියපාචරියානං නටානං භාසමානානං යො සො නටො රඞ්ගමජ්ඣෙ සමජ්ජමජ්ඣෙ සච්චාලිකෙන ජනං හාසෙති රමෙති, සො කායස්ස භෙදා පරම්මරණා පහාසානං දෙවානං සහව්‍යතං උපපජ්ජතීති. ඉධ භගවා කිමාහාති.

අලං ගාමණි තිට්ඨතෙතං, මා මං එතං පුච්ඡී[2]ති. දුතියම්පි ඛො තාලපුටො නටගාමණි භගවන්තං එතදවොච: සුතං මෙතං භන්තෙ පුබ්බකානං ආචරියපාචරියානං නටානං භාසමානානං යො සො නටො රඞ්ගමජ්ඣෙ සමජ්ජමජ්ඣෙ සච්චාලිකෙන ජනං හාසෙති රමෙති, සො කායස්ස භෙදා පරම්මරණා පහාසානං දෙවානං සහව්‍යතං උපපජ්ජතී ති ඉධ භගවා කිමාහාති. අලං ගාමණි තිට්ඨතෙතං මා මං එතං පුච්ඡීති. තතියම්පි ඛො තාලපුටො නටගාමණි භගවන්තං එතදවොච, සුතං මෙතං භන්තෙ පුබ්බකානං ආචරියපාචරියානං නටානං භාසමානානං යො සො නටො රඞ්ගමජ්ඣෙ සමජ්ජමජ්ඣෙ සච්චාලිකෙන ජනං හාසෙති රමෙති, සො කායස්ස භෙදා පරම්මරණා පහාසානං දෙවානං සහව්‍යතං උපපජ්ජතීති. ඉධ භගවා කිමාහාති.

---

1. තාලපුත්තො සයා, අට්ඨකථා
2. පුච්ඡාති සී 1

## 8. 1. 2

# තාලපුට සූත්‍රය

416. එක්සමයෙක භාග්‍යවතුන් වහන්සේ රජගහ නුවර සමීපයෙහි කලන්දකනිවාප නම් වේළුවනාරාමයෙහි වැඩවසන සේක. එකල්හි තාලපුට නම් නටගාමණී තෙමේ භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹියේ ය. එළඹ භාග්‍යවතුන් වහන්සේ වැඳ එකත්පස්ව හුන්නේ ය. එකත්පස්ව හුන් තාලපුට නටගාමණී තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය: වහන්ස යම් ඒ නළුවෙක් රඟමැද නැටුම් මැද ඇත්තෙනුත් බොරුවෙනුත් ජනයා සතුටු කරවා ද, ඇලුම් කරවා ද, හෙතෙමේ කාබුන් මරණින් මතු පහාස දෙවියන්ගේ සහභාවයට පැමිණේ යයි. මෙය මා විසින් පෙර විසූ ඇජර පැජර නළුවන් කියද්දී අසන ලදී. මෙහිලා භාග්‍යවතුන් වහන්සේ කුමක් වදරන සේක්දැ යි.

ගාමණී, කම් නැත. මෙය තිබෙව්වා. මෙය නහමක් මා පුළුවුස් වයි. දෙවනවට ද තාලපුට නටගාමණී තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය: වහන්ස, යම් ඒ නළුවෙක් රඟමැද නැටුම් මැද ඇත්තෙනුත් බොරුවෙනුත් ජනයා සතුටු කරවා ද, ඇලුම් කරවා ද, හෙතෙමේ කාබුන් මරණින් මතු පහාස දෙවියන්ගේ සහභාවයට පැමිණේ ය යි මෙය මා විසින් පෙරවිසූ ඇජර පැජර නළුවන් කියද්දී අසන ලදී. මෙහිලා භාග්‍යවතුන් වහන්සේ කුමක් වදරන සේක් දැ යි. ගාමණී, කම් නැත. මෙය තිබෙව්වා. මෙය නහමක් මා පුළුවුස්වයි, තෙවන වට ද තාලපුට නටගාමණී තෙමේ භාග්‍යවතුන් වහන්සේට මෙය සැලකෙළේ ය: වහන්ස, යම් ඒ නළුවෙක් රඟමැද නැටුම්මැද සැබෑවෙනුත් බොරුවෙනුත් ජනයා සිනා ගන්වා ද ඇලුම් කරවා ද හෙතෙමේ කාබුන් මරණින් මතු පහාස දෙවියන්ගේ සහභාවයට පැමිණේ ය යි මෙය මා විසින් පෙර විසූ ඇජර පැජර නළුවන් කියද්දී අසන ලදී. මෙහි ලා භාග්‍යවතුන් වහන්සේ කුමක් වදරන සේක්දැ යි.

අද්ධා ඛො ත්‍යාහං ගාමණි, න ලභාමි[1] "අලං ගාමණි තිට්ඨතේතං මා මං එතං පුච්ඡී"ති. අපි ච ත්‍යාහං ව්‍යාකරිස්සාමි. පුබ්බෙ ඛො ගාමණි, සත්තා අවීතරාගා රාගබන්ධනබද්ධා,[2] තෙසං නටො රඞ්ගමජ්ඣෙ සමජ්ජමජ්ඣෙ යෙ ධම්මා රජනීයා තෙ උපසංහරති භිය්‍යො සරාගාය[3]. පුබ්බෙ ඛො ගාමණි සත්තා අවීතදොසා දොසබන්ධනබද්ධා, තෙසං නටො රඞ්ගමජ්ඣෙ සමජ්ජමජ්ඣෙ යෙ ධම්මා දොසනීයා තෙ උපසංහරති භිය්‍යො සදොසාය[3]. පුබ්බෙ ඛො ගාමණි, සත්තා අවීතමොහා මොහබන්ධනබද්ධා, තෙසං නටො රඞ්ගමජ්ඣෙ සමජ්ජමජ්ඣෙ යෙ ධම්මා මොහනීයා තෙ උපසංහරති භිය්‍යො සමොහාය[3]. සො අත්තනා මත්තො පමත්තො පරෙ මදෙත්වා පමාදෙත්වා කායස්ස භෙද පරම්මරණා පහාසො නාම නිරයො තත්‍රූපපජ්ජති[4].

සචෙ ඛො පනස්ස එවං දිට්ඨි හොති "යො සො නටො රඞ්ගමජ්ඣෙ සමජ්ජමජ්ඣෙ සච්චාලිකෙන ජනං හාසෙති රමෙති, සො කායස්ස භෙද පරම්මරණා පහාසානං දෙවානං සහව්‍යතං උපපජ්ජතී"ති සාස්ස හොති මිච්ඡා දිට්ඨි, මිච්ඡා දිට්ඨිකස්ස ඛො පනාහං ගාමණි පුරිසපුග්ගලස්ස ද්වින්නං ගතීනං අඤ්ඤතරං ගතිං වදමි නිරයං වා තිරච්ඡානයොනිං වාති.

එවං වුත්තෙ තාලපුටො නටගාමණි පරොදි, අස්සූනි පවත්තෙසි. "එතං ඛො ත්‍යාහං ගාමණි නාලත්ථං, අලං ගාමණි තිට්ඨතේතං මා මං එතං පුච්ඡී"ති.

නාහං භන්තෙ එතං රොදමි, යං මං භගවා එවමාහ, අපිචාහං භන්තෙ පුබ්බකෙහි ආචරියපාචරියෙහි නටෙහි දීඝරත්තං නිකතො වඤ්චිතො පරද්ධො[5]: "යො සො නටො රඞ්ගමජ්ඣෙ සමජ්ජමජ්ඣෙ සච්චාලිකෙන ජනං හාසෙති රමෙති, සො කායස්ස භෙද පරම්මරණා පහාසානං දෙවානං සහව්‍යතං උපපජ්ජතී"ති.

අභික්කන්තං භන්තෙ, අභික්කන්තං භන්තෙ, සෙය්‍යථාපි භන්තෙ නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය, පටිච්ඡන්නං වා විවරෙය්‍ය, මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය, අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛින්තීති. එවමෙවං භගවතා අනෙකපරියායෙන ධම්මො පකාසිතො. එසාහං භන්තෙ භගවන්තං සරණං ගච්ඡාමි ධම්මඤ්ච භික්ඛුසඞ්ඝඤ්ච, ලභෙය්‍යාහං භන්තෙ භගවතො සන්තිකෙ පබ්බජ්ජං ලභෙය්‍යං උපසම්පදන්ති. අලත්ථ ඛො තාලපුටො නටගාමිණී භගවතො සන්තිකෙ පබ්බජ්ජං, අලත්ථූපසම්පදං, අචිරූපසම්පන්නො ච පනායස්මා තාලපුටො එකො වූපකට්ඨො අප්පමත්තො ආතාපී පහිතත්තො විහරන්තො -පෙ- අඤ්ඤතරො ච පනායස්මා තාලපුටො අරහතං අහොසීති.

1. නාලත්ථං — ස්‍යා, PTS
2. බන්ධා — ස්‍යා.
3. භිය්‍යොසොමත්තාය — මජ්සං
4. තත්‍ථ උපපජ්ජති — මජ්සං, ස්‍යා.
5. පලුද්ධා—මජ්සං, ස්‍යා

ගාමණි මම ''ගාමණි, කම් නැත, මෙය තිබෙවා. මෙය නහමක් මා පුළුවුස් ව'' යි තොපගෙන් ඒකාන්තයෙන් නො ලබමි. යලිදු තොපට මම විසඳන්නෙමි. ගාමණි, පෙර සත්ත්වයෝ නො පහ වූ රාග ඇතියහ. රාග බැඳුමෙන් බැඳුණහ. ඔවුන්ට නළු තෙමේ රඟමැද නැටුම්මැද යම් දහම්හු ඇලුම් කටයුත්තාහු නම් ඔවුන් බෙහෙවින් රාග සහිත වීම පිණිස එළවා දක්ව යි. ගාමණි, පෙර සත්ත්වයෝ නො පහ වූ දෙස ඇතියහ. දෙසබැඳුමෙන් බැඳුණහ. ඔවුන්ට නළු තෙමේ රඟ මැද නැටුම් මැද යම් දහම්හු දෙසයට කරුණු වෙති නම් ඔවුන් බෙහෙවින් දෙස සහිත වීම පිණිස එලවා දක්වයි. ගාමණි, පෙර සත්ත්වයෝ නොපහ වූ මොහ ඇතියහ. මොහබැඳුමෙන් බැඳුණහ. ඔවුන්ට නළු තෙමේ රඟ මැද නැටුම් මැද යම් දහම්හු මොහයට කරුණු වෙත් නම් ඔවුන් බෙහෙවින් මොහ සහිත වීම පිණිස එළවා දක්වයි.

හේ තෙමේ මත්වූයේ පමා වූයේ මෙරමා මත් කරවා පමා කරවා කාබුන් මරණින් මතු පහාස නම් නිරයෙක් වේ නම් එහි උපදී. ඉදින් ඔහුට ''යම් ඒ නළුවෙක් රඟමැද නැටුම් මැද සැබැවෙනුත් බොරුවෙනුත් ජනයා සිනා ගන්වා ද ඇලුම් කරවා ද හෙතෙමේ කාබුන් මරණින් මතු පහාස නම් දෙවියන්ගේ සහභාවයට පැමිණේ ය'' යි මෙබඳු දිටෙක් වේ නම් ඒ ඔහුගේ මිසදිටු වේ. ගාමණි, මිසදිටු ගත් පුරිස පුඟුල්හට නිරය හෝ තිරිසන් යොනිය හෝ දෙගති අතුරෙන් එක්තරා ගතියක් කියමි යි.

මෙසේ වදළ කල්හි තාලපුට නටගාමණි තෙමේ හැඬී ය. කඳුලු හෙළී ය. ගාමණි මම ''ගාමණි, කම් නැත. මෙය තිබෙවා, මෙය නහමක් මා පුළුවුස්ව'' යි මෙය තොපගෙන් නො ලදිමි.

වහන්ස, භාග්‍යවතුන් වහන්සේ මට යමක් වදළ සේක් නම් මේ ගැන මම නො හඬමි. වහන්ස, වැලිදු ''යම් ඒ නළුවෙක් රඟමැද නැටුම්මැද සැබැවෙනුත් බොරුවෙනුත් ජනයා සිනා ගන්වා ද ඇලුම් කරවාද හෙතෙමේ කාබුන් මරණින් මතු පහාස දෙවියන්ගේ සහභාවයට පැමිණේ ය'' යි පෙර විසූ ඇජර පැජර නළුවන් විසින් මම දිගුකලක් මුළුල්ලෙහි මුළා කරන ලද්දෙමි. රවටන ලද්දෙමි. වරද්දන ලද්දෙමි.

වහන්ස ඉතා මැනවි. වහන්ස, යම්සේ යටිකුරු වූවක් හෝ උඩුකුරු කරන්නේ ද වැසුණු දෑයක් හෝ වැසුම් හරින්නේ ද මංමුළා වූවකුට හෝ මඟ කියා දෙන්නේ ද ඇස් ඇත්තෝ රූ දක්නාහයි අඳුරෙහි හෝ තෙල් පහනක් දරන්නේ ද එසෙයින් ම භාග්‍යවතුන් වහන්සේ විසින් නොයෙක් නයින් දහම් පවසන ලදි. වහන්ස, මේ මම භාග්‍යවතුන් වහන්සේත් දහමත් බික්සඟනත් සරණ යෙමි. වහන්ස, මම භාග්‍යවතුන් වහන්සේ ලඟ පැවිද්ද ලබන්නෙමි. උපසපුව ලබන්නෙමි යි. තාලපුට නටගාමණි තෙමේ භාග්‍යවතුන් වහන්සේ ලඟ පැවිද්ද ලදි. උපසපුව ලදි. උපසපන් වූ නොබෝ කල් ඇති ආයුෂ්මත් තාලපුට තෙරණුවෝ එකලා ව ගණයා කෙරෙන් වෙන් ව නො පමා ව කෙලෙස් තවන වෙර ඇති ව නිවන් පිණිස මෙහෙයූ සිත් ඇති ව වෙසෙන්නාහු ... ආයුෂ්මත් තාලපුට තෙරණුවෝ රහතුන් අතුරෙන් එක්තරා කෙනෙක් ද වූහ යි.

T 37